**නැගෙනහිර පළාත් සභාව - 2018**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නැගෙනහිර පළාත් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාරව සහ පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින නිකුත් කරන ලදි. විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, නැගෙනහිර පළාත් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පළාත් භාණ්ඩාගාරය ඇතුළු විවිධ පළාත් ආයතනවල කළමනාකරණය වගකීම දරයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

.

- කළමනාකරණය විසින් භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ ගිණුම්කරන හෙළිදරව් කිරීම් සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරන අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | පළාත් සභාවට විරුද්ධව තෙවන පාර්ශව විසින් ගොනුකරන ලද නඩු 72 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල පළාත් සභාව විසින් අසම්භව්‍ය වගකීම් හෙළිදරවු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරවු කිරීමට කටයුතු කළ යුතුයි. | වර්තමානයේ පළාත් සභාව මුදල් පදනම් කර ගත් ගිණුම්කරන පද්ධතිය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ. කෙසේ වුවත්, අනාගතයේදී මූල්‍ය ප්‍රකාශන තුල අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | 2004 සිට 2017 දක්වා කාල සීමාවක් සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට කලාප අධ්‍යාපන කාර්යාල 03 ක් විසින් ගෙවිය යුතු දුම්රිය බලපත්‍ර ගාස්තු රු .6,679,889 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා වගකීම් යටතේ පෙන්වා නොතිබුණි. | හිඟහිටි ශේෂය අයකිරීමට හෝ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරවු කිරීමට කටයුතු කළ යුතුයි. | හිඟහිටි දුම්රිය බලපත්‍ර ගාස්තු ඉදිරියේදී සම්පූර්ණයෙන් පියවීමට කටයුතු කරනු ලැබේ. |

**2. ආදායම් කළමනාකරණය**

**2.1 පළාත් අදායම් කොමසාරිස් පත් නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2008 අංක 01 දරන මුදල් ප්‍රඥප්තියේ 2 වන වගන්තියට අනුව, පළාත් ආදායම් කොමසාරිස්වරයකු පත් කළ යුතුය. 2011 දෙසැම්බර් 18 දින සිට පළාත් ආදායම් කොමසාරිස් තනතුර පුරප්පාඩු වී තිබුණද, නැගෙනහිර පළාතේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත සේවා ව්‍යවස්ථාව සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ 3.2 වගන්තිය ප්‍රකාරව මෙම තනතුර පිරවීමට පළාත් සභාව පියවර ගෙන නොමැත. වසර 07 ක් කාලයක පළාත් ආදායම් කොමසාරිස්වරයෙකු පත් නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස, මුදල් ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි නැගෙනහිර පළාතේ පළාත් ආදායම් එකතු කිරීම හා පරිපාලනය කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම්වලට විශාල වශයෙන් බලපා තිබුණි. | මුදල් ප්‍රඥප්තියට අනුව පළාත් ආදායම් කොමසාරිස් තනතුර පිරවීමට පියවර ගත යුතුය. | සුදුසු පළාත් ආදායම් කොමසාරිස්වරයකු බඳවා ගැනීමට පියවර ගනු ලැබේ. |

## 2.2 මුද්දර ගාස්තු හා උසාවි දඩ අයකිරීම් කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නැගෙනහිර පළාතේ ඉඩම් රෙජිස්ට්‍රාර් හි ඉඩම් ලියාපදිංචි කිරීමෙන් මුද්දර ගාස්තු එකතු කිරීම සම්බන්ධව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2017 සහ 2018 වර්ෂය තුළ සිදු කරන ලද ජංගම සේවයට අනුව, මුද්දර ගාස්තු ලෙස අඩු මුදලක් ගෙවීම සඳහා ඉඩම් හිමියන් 794 දෙනෙකු තම ඉඩම් සඳහා අඩු වටිනාකමක් ප්‍රකාශයට පත් කර ඇති බව අනාවරණය විය. එබැවින් අඩුතක්සේරු දේපල සඳහා රු.14,190,769 ක අතිරේක මුද්දර ගාස්තු පනවා ඇත. කෙසේවෙතත්, එම ඉඩම් අයිත්කරුවන් වෙත පැනවූ හිඟ ගාස්තු රු. 4,766,793 ක් නැවත අයකරගැනීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව 2018 දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි. | ආපසු අයකර ගැනීම සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයා පත් කිරීමට පියවර ගත යුතුය.. | පළාත් ආදායම් කොමසාරිස් ධුරයට පත් වූ පසු හිඟ මුදල් ආපසු අයකර ගැනීමට අපට අධිකරණයෙන් පියවර ගත හැකිය. |
| (ආ) | ඉඩම් තක්සේරු නොකිරීම හේතුවෙන් අතිරේක මුද්දර ගාස්තු සත්‍යාපනය කිරීම සහ පැනවීම සඳහා 2012 සිට 2018 දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ ලියාපදිංචි කර ඇති ඔප්පු හත්දහස් හයසිය දහසයක් (7,616) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් තක්සේරු නොතිබුණි. | ඔප්පු පිළිබඳ තක්සේරු කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. | අඩු වටිනාකම් ඔප්පු කිරීම තකසේරු කිරීම සඳහා මානව සම්පත් හිඟකම දෙපාර්තමේන්තුව මුහුණ දෙන ප්‍රධාන බාධාවක් වී ඇති අතර, අම්පාර සහ මඩකලපුවෙහි ප්‍රාදේශීය කාර්යාල 2013 සිට වසා දමා තිබේ. |

## 2.3 හිඟහිටි ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක රජයේ ඉඩම් වලට අදාලව රු. 208,313,183 ක කල්බදු ආදායම් 1991 වර්ෂයේ සිට හිඟහිටව පැවතුනි. කෙසේවෙතත්, 2019 අප්‍රේල් 30 දින දක්වාම එම හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි. | හිඟ කල්බදු ආදායම් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | චක්‍රලේඛ අංක 1992/58 ප්‍රකාරව, කල්බදු අයකිරීම් බලය ප්‍රාදේශීය ලේකම් වෙත පවරා තිබුණි. නමුත්, යුධ තත්ත්වය හේතුවෙන් මෙම ප්‍රදේශයේ එම වැඩපිළිවෙල පමා විය. |

| | | |
|---|---|---|
| (ආ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 10 ක් ගතවී ඇතත්, නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වන උකස් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමට හා මේ සම්බන්ධයෙන් වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ප්‍රඥප්තියක් බලාත්මක කර නොතිබුණි. | උකස් මධ්‍යස්ථාන සඳහා පළාත් ප්‍රඥප්තිය බලාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | උකස් මධ්‍යස්ථාන සඳහා ප්‍රඥප්තියයක් භාෂා 3න් කෙටුම්පත් කර ඇති අතර සභාව ආරම්භ වූ පසු ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

---------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පළාත් සභාවේ මෙහෙයුම් කටයුතු වලින් ලද අතිරික්තය රු. 1,708,421,018 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,434,433,298 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 726,012,280 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන රු. 1,664,374,790 න් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. ප්‍රඥප්ති ගිණුම්**

-----------------------

**4.1 නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් බස් පර්යන්ත වෙත බස්රථ ලඟාවීම හා පිටවීම පටිගත වන සාමාන්‍ය පැකට් ගුවන් විදුලි සේවය (**GPRS**) සහිතව විකුණුම් උපකරණ (**POS**) 13 ක් සහ ටිකට් රෝල් 2000 ක් 2015 ජුනි 08 දින රු. **1,142,000** ක පිරිවැයකට මිලදී ගෙන තිබුණි. කෙසෙවෙතත්, මෙම මැෂින් ක්‍රියාත්මක කිරීමට විධිමත් මෘදුකාංග පද්ධතියක් නොමැති වීමෙන් අදාල අරමුණ උදෙසා වසර 4ක් භාවිතා තර නොතිබුණි. | විකුණුම් උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. | වසර කිහිපයක් ක්‍රියාත්මක නොවීමෙන් පසු පද්ධතිය පරීක්ෂණ කාලයක් යටතේ ක්‍රියාත්මක වේ. මෙම මෘදුකාංගය විධිමත්ව ක්‍රියාත්මක වුවහොත් ඉදිරියේදී ක්‍රියාත්මක කළ හැකි වේ. |

**4.2 නැගෙනහිර පළාත් පළාත් නිවාස අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය මගින් සකස් කර තිබූ නිවාස සංවර්ධන සැලැස්ම (2015-2019) ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 3,225 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් නිවාස නොමැති පවුල් 6,600 කට නිවාස ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවුවත්, උපමාන පාදක අධාර යටතේ ප්‍රතිලාභීන් 50 කට රු.10,600,000 ක නිවාස ආධාර හා වැසිකිළි 300 ක් ඉදිකිරීමට රු.7,500,000 ක මුල්‍යාධාර සැපයීම හැර සමාලෝචිත වර්ෂය තුල කිසිදු නිවසක් ඉදිකර නොතිබුණි. | ස්වයං අරමුදල් උත්පාදනය තුලින් නිවාස සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | අරමුදල් නොමැති වීම හේතුවෙන් යෝජිත නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ නොහැකි වේ. |

**5. මෙහෙයුම් සමාලෝචනය**

**5.1 කාර්යසාධන සමාලෝචනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, නැගෙනහිර පළාත් සභාවේ විෂය පථය යටතට ගැනෙන ආයතන වල නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂය තුල කාර්යක්ෂමතා කඩඉම් විභාග 38 ක් පැවැත්විය යුතුවේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුල කාර්යක්ෂමතා කඩඉම් විභාග 11 ක් පවත්වා නොතිබුණි. තවද, 2018 අප්‍රේල් 24 වන දින කාර්යක්ෂමතා කඩඉම් විභාග 2ක් සඳහා ඉල්ලුම්පත් ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂය තුල පවත්වා නොතිබුණි | කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත කාලයේදී පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. | යම් යම් තාක්ෂණික සේවා සඳහා සම්පත් නොමැතිවීම හේතුවෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයන් 2019 වර්ෂයට කල්දමන ලද අතර ඉමත කාර්යක්ෂමතා කඩඉම් විභාගයන් 2019 අගෝස්තු වලට පෙර පැවැත්වීමට කටයුතු කර තිබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/EPC/B/14/R/H හා 2014 ජුනි 20 දිනැති ලිපිය ප්‍රකාරව, පළාත් නිවාස අධිකාරිය ඒකාබද්ධ අරමුදල මත යැපීම වෙනුවට ස්වයං අරමුදල් උත්පාදනය කිරීමේ කොන්දේසිය මත 2014 වර්ෂයේදී වැටුප් හා අනෙකුත් වියදම් සඳහා අරමුදල් සපයා තිබුණි. කෙසේවෙතත්, අධිකාරිය පිහිටුවා වසර 4ක් ගතවී ඇතත්, වියදම් දැරීම සඳහා අරමුදල් උත්පාදනයට කිසිදු ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කිරීමට අධිකාරිය සමත් වී නොතිබුණි. | ස්වයං මූල්‍ය අරමුදල් උත්පාදනයට නොපමාව කටයුතු කළ යුතුවේ. | ප්‍රමාණවත් සජීර කාර්යමණ්ඩලයක් නොමැති වීම හා ආදායම් උත්පාදන ආයෝජන කටයුතු සඳහා ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් මේ අවස්ථාවේ කිසිදු ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කිරීම ඉතාමත් අපහසු කාර්යයකි. කෙසේවුවත්, තම සංවර්ධන කටයුතු සඳහා අරමුදල් රැස්කරන අධිකාරින් හරහා ලාභය පදනම් කරගත් කටයුත්තක් ඇරඹීමට විවිධ මූල්‍යයන ආයතන වලට හා මධ්‍යම අමාත්‍යාංශ වලට අධිකාරිය විසින් ව්‍යාපෘති යෝජනා සකස් කර ඉදිරිපත් කර තිබේ. නමුත් අරමුදල් හවුල්කරුවන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොවීම හේතුකොටගෙන එම සියළුම උත්සාහයන් අසාර්ථක වෙමින් පවතී. ත්‍රිකුණාමලය නගර සභාවේ ඇති භාවිතා නොකළ අදාල යන්ත්‍රෝපකරණ භාවිතා කරමින් ත්‍රිකුණාමලයේ පාංශු පරීක්ෂණ ඒකකයක් ඉදිරියේදී ස්ථාපිත කිරීමට අධිකාරිය දැනට සැලසුම් කරයි. |

## 5.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | -------------- | ------------------------ |
| (අ) | වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 6න් වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 3 ක් වසර 9 කට වැඩි කාලයක් ක්‍රියාත්මක වී නොතිබුණි. කෙසේවෙතත්, එම වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 3 ඇවර කිරීමට කටයුතු කර නොතිබුණි. | වාණිජ නොවන අත්තිකාරම් ගිණුම් කටයුතු ඇවර කිරීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රියාත්මක නොවන වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු ඇවර කිරීමට පසුවිපරම් කටයුතු කෙරෙමින් පවතී. |
| (ආ) | නැගෙනහිර පළාතේ හොඳ ජංගම දිගු සේවයක් සැපයීමේ අරමුණින් පළාත් නිශ්චිත සංවර්ධන ආධාර (PSDG) යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් රු.10,500,000 ක් වියදම් දරා ජංගම | මෙම මධ්‍යස්ථානය අදාල අරමුණු උදෙසා භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. | කරදියනාරු සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යය වන්නේ, නිශ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීමට වැඩිදියුණු කරන ලද කෘෂිකාර්මික ක්‍රමවේදයන් |

| | | |
|---|---|---|
| දිගු සේවා මධ්‍යස්ථානයක් (පාංශු පරීක්ෂණ රසායනාගාර) ඉදිකරමින් පවතී. කෙසේවෙතත්, කරදියනාරු හි පවතින සේවාස්ථ පුහුණු ගොඩනැගිල්ල පිළිබඳව හෝ නොසලකා මෙම ගොඩනැගිල්ලේ අවශ්‍යතාවය හඳුනාගැනීමට දෙපාර්තමේන්තුව මගින් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබුණි. | | ව්‍යාප්ත කිරීමට න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව තුලින් ධාරිතාවය ගොඩනැංවීම මගින් ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ගේ හා ගොවියන්ගේ ධාරිතාවය හා නිපුණතාවය ශක්තිමත් කිරීමයි. පාංශු පරීක්ෂණ කටයුතු මෙම සේවා මධ්‍යස්ථානයේ කාර්යයන් වලට අදාල නොවේ. පාංශු පරීක්ෂණ කටයුතු සඳහා සේවා පුහුණු මධ්‍යස්ථානයේ මෙහෙයුම් සැලැස්මේ ඇතුලත් නොවන ගොඩනැගිලි, රසායනාගාර සහ විශේෂ පෙරීමේ උපකරණ මෙන්ම පුහුණු වූ මානව සම්පත්ද අවශ්‍ය වේ. පළාත් නිශ්චිත සංවර්ධන ආධාර තුල කෘෂිකර්මාන්ත අංශය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම හරහා නැගෙනහිර පළාතේ වගා ගොවියාගේ ප්‍රතිලාභය සඳහා මෙම පාංශු පරීක්ෂණ පහසුකම් ත්‍රිකුණාමලයේ ස්ථාපිත කිරීමට සමහර අවස්ථාවලදී තීරණය කෙරුණි. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ වහා අපේක්ෂිත ප්‍රමාණය මත පාංශු පරීක්ෂණ පහසුකම් ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 5.3 දෘෂ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැගෙනහිර පළාතේ පෙර පාසැල් 21 කට බෙදාහැරීම සඳහා උපමාන පාදක ආධාර යටතේ රු.608,000 ක් වටිනා ලීබඩු හා ක්‍රීඩා භාණ්ඩ වැනි උපකරණ 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබූ අතර 2019 මාර්තු 31 දින වන විටත් අදාල පෙර පාසැල් වෙත එම උපකරණ සපයා නොතිබුණි. කෙසේවෙතත්. පෙර පාසැල් අධ්‍යන අංශය විසින් ඉහත භාණ්ඩ සඳහා වන මුදල් 2017 වර්ෂයේදී භාණ්ඩ සැපයීමට පෙර සැපයුම්කරුට ගෙවා | භාණ්ඩ සැපයීමෙන් පසු මුදල් ගෙවීමට සහ මෙවැනි අවභාවිතයන් නැවැත්වීමට අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කමිටුවක් පත්කර ඇති අතර අදාල කරුණ විමසා පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ අරමුදලින් සිදුකර ඇති මිලදීගැනීම් කටයුතු පිළිබඳව වාර්තාවක්ද ඉදිරිපත් කිරීමට නියමිතය. එම පරීක්ෂණ වාර්තාවේ ඇති යෝජනා හා නිර්දේශ අනුව කටයුතු කරනු ලැබේ. |

තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රජයේ අරමුදල් අවභාවිතා වී තිබෙන බව නිරීක්ෂණය විය.

## 5.4 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා

---

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කින්නියා කළාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසැලක සිසුන් 66 දෙනෙකුගේ භාවිතය සඳහා තාක්ෂණික පීඨ ගොඩනැගිල්ලක් රු. මිලියන 23.6 ක පිරිවැයට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කෙසේවෙතත්, 2019 අප්‍රේල් 30 වන දින වන විටද අදාල කොන්ත්‍රාත්තුව නිම කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අනිවාර්ය ප්‍රායෝගික පුහුණුවීම් 66 අතුරින් මෙම තාක්ෂණික පීඨයේ සිසුන්ට සම්පූර්ණ කළ හැකිව තිබුණේ ප්‍රායෝගික අධ්‍යනයන් 10 ක් පමණි. තවද, අදාල උපකරණ සිසුන් විසින් ප්‍රයෝජනයට නොගෙන පාසැලේ නිශ්ක්‍රීයට පැවතුණි. | කොන්ත්‍රාත්තුව නිම කිරීමට හා අදාල උපකරණ භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. | ක්‍රියාමාර්ග ගණනාවක් සහ අධීක්ෂණයන් කොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණද, මෙම ගොඩනැගිල්ල නියමිත කාලයේදී නිම කිරීමට නොහැකිවී ඇත. එබැවින්, මෙම කාර්යය නතරකළ අතර කාර්යය නිම කිරීමට නැවත මිලගණන් කැඳවා ඇත. එසේම, ඉහත කොන්ත්‍රාත්කරුගේ නම අසාදු ලේඛණයට එක් කිරීමට කටයුතු කර තිබේ. |
| (ආ) | ප්‍රාථමික සිසුන් 459 ක් පදිංචි කරවීමේ අරමුණින් මඩකළපුව මධ්‍ය කළාපයේ කාතාන්කුඩි පාසැල් වලින් එකක තට්ටු 2න් සමන්විත ගොඩනැගිල්ලක් ඇළ මාර්ගයක් හරහා රු. 11,145,438 ක් වියදම් දරා ඉදිකර තිබූ අතර එහිදී ඇළ මාර්ගය අවහිර වීම වැනි පාරිසරික බලපෑම් නොසලකා තිබුණු අතර නාගරික සංවර්ධන අධිකාරියෙන් හා මධ්‍යම පාරිසරික අධිකාරියෙන් පූර්ව අනුමැතියද ලබාගෙන නොතිබුණි. මේ හේතුවෙන්, ඇළ මාර්ගයේ ගලා යන ජලය බැසයාම ඉතා අඩු වේගයකින් සිදුවන අතර ජලය එකතැන රැඳීම නිසා මදුරුවන් බෝවන ස්ථානයක් බවට පත්ව තිබුණි. | පරිසර හිතකාමී ස්ථානවල ප්‍රාථමික පාසැල් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු අතර මෙම පාසැලේ එක් කොටසක් ලඟම ඇති හිස් ඉඩමක නැවත ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | මෙම අරමුදල කාතාන්කුඩි ප්‍රදේශයේ ඇමතිවරයකුගෙන් ලැබී ඇති බව මඩකළපුව මධ්‍යම කළාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් ඔහුගේ වාර්තාවක සඳහන් කර තිබේ. එසේම අප මෙහි පාරිසරික අංගය මෙන්ම සිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වයද සැලකිල්ලට ගෙන මෙම කාර්යය නවත්වන ලෙස මඩකළපුව කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකට දැනුම් දී ඇත. |

**5.5 වත්කම් කළමනාකරණය**

**5.5.1 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැගෙනහිර පළාතේ තෝරාගත් මූලික රෝහල් 5කට සංඛ්‍යාංක සෞඛ්‍ය ව්‍යාපෘතිය (Digital Health Project) යටතේ රු. මිලියන 12.32 ක් 2017 වර්ෂයේදී වියදම් දරා තිබුණි. කෙසේවෙතත්, ලැප්ටොප් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, HD කැමරා, කේත කියවනය (Barcode Readers) සහ සර්වර් වැනි රු. මිලියන 12.32 ක් වටිනා උපකරණ 2018 නොවැම්බර් 30 දක්වා අදාල අරමුණ වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | වත්කම් නියමිත කාලයට භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | වෛද්‍ය උපකරණ උපයෝජනයට කටයුතු කර ඇති අතර මධ්‍යම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාගන්නා ලෙස උපදෙස් දී තිබේ. |

**5.6 ප්‍රසම්පාදන**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිදන්ගත වකුගඩු රෝගීන් වාර්තා නොවීම නිසා නින්දවූර් සහ වාලච්චේන මූලික රෝහල් වල පෙරීමේ ඒකක ස්ථාපිත කර නොතිබුණි. කෙසේවෙතත්, අවශ්‍යතාවය ගැන සැලකිල්ලක් නොදක්වා පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් එම රෝහල් වලට රු. 18,555,000 ක පෙරීමේ උපකරණ සහ රු. 6,147,426 ක ඖෂධ සපයා තිබුණි. මේ හේතුවෙන් එම උපකරණ 2017 මාර්තු 22 දින සිට මේ දක්වා නිශ්ක්‍රීයව පැවතුනි. | පෙරීමේ ඒකකයක් ස්ථාපිත කිරීමට හෝ අදාල උපකරණ අවශ්‍යතා සහිත රෝහල් වලට මාරු කිරීමට හෝ කටයුතු කළ යුතුවේ. | වෛද්‍ය විශේෂඥවරුන්ගේ හිඟය හේතුවෙන් කින්නියා, මූතූර් හා වාලච්චේන රෝහල්වලද ක්‍රියාත්මක නොවේ. |